පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 79

ආයතනයේ නම: පරිසර අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79
நிறுவனத்தின் பெயர்: சுற்றாடல் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79
Name of the Institution: Ministry of Environment

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : පරිසර අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමු කොටස	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 02/2021(ii) අනුව වක්‍රීය ක්‍රමය මත පදනම්ව නිලධාරීන් සේවයට කැඳවීම නිසා මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් මාසයක් ඇතුළත පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත. එසේ වුවද විගණකාධිපතිවරයාගේ සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අමාත්‍යාංශය සතු වාහන 53 ක් ඇත. එයින් 50 ක් සඳහා අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ ඇත. අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැති වාහන සම්බන්ධයෙන් පහත තොරතුරු සඳහන් කරමි. i. KO 8812 දරන මෝටර් රථය - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත්ව තිබූ අතර මහවැලි අංශය වෙතින් තාවකාලිකව මෙම අමාත්‍යාංශය වෙත ලබාගෙන ඇත. පරිසර අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව පවරා දෙන ලෙස ඉල්ලා ඇතත් ඒ සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපියක් ලැබී

	නොමැත. ii. GW 1326 දරන ජීප් රථය - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පැවති මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතියේ රාජකාරී සඳහා යොදවා තිබූ මෙම ජීප් රථය එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය අවසන් වූ පසු පරිසර අමාත්‍යාංශය වෙත භාර දී ඇත. මෙම ජීප් රථය පවරා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇතත් පිළිතුරක් ලැබී නොමැත. අමාත්‍යාංශ නාමයන් සංශෝධනය වීම හේතුවෙන් මෙම ජීප් රථය පවරා ගැනීමට නොහැකි වී ඇත. මෝටර් රථ පවරා ගැනීම සම්බන්ධයෙන් කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ උපදෙස් පරිදි 2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 අනුව කටයුතු කරනු ලැබේ. iii. KB 7120 දරන මෝටර් රථය - රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. මෙතෙක් පරිසර අමාත්‍යාංශයට පවරා ගැනීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කර නොමැත. එබැවින් මෝටර් රථ පවරා ගැනීම සම්බන්ධයෙන් කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ උපදෙස් පරිදි 2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 අනුව කටයුතු කරනු ලැබේ.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැති වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
වාහන ගර්භිත වී මාස 08 ට වඩා අඩු	1. 65-1578 දරන ජීප් රථය -

කාලයක දී අපහරණය කර නොතිබුණි.	මිල ගණන් කැඳවා HI Tech Motors ආයතනය වෙත අළුත්වැඩියා කිරීම සඳහා භාර දී ඇත. 2. HQ 4331 දරන ජීප් රථය - එම රථයේ දේශීය නියෝජිතයන් වන United Motors ආයතනය වෙත යොමු කර ඇත. ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන හෙයින් අළුත්වැඩියා කිරීමට තීරණයක් ගෙන නොමැත. 3. HK 8894 දරන මෝටර් රථය - අපහරණය කිරීමට නියමිතය. ඒ සඳහා තක්සේරු වාර්තාව ලබාගෙන ඇත. 4. KK 9635 දරන මෝටර් රථය - අපහරණය කිරීමට නියමිත අතර ඒ සඳහා තක්සේරු වාර්තාව ලබා ගෙන ඇත. 5. KB 7120 දරන මෝටර් රථය - මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක ප්‍රතිපාදනයන් මගින් අළුත්වැඩියා කර එම ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් සඳහා යොදවා ඇත 6. KH -9235 දරන මෝටර් රථය - අපහරණය කිරීමට නියමිත අතර තක්සේරු වාර්තාව ලබාගෙන ඇත. 7. CAC – 0172 දරන මෝටර් රථය - අළුත්වැඩියාව සඳහා ලියනගේ මෝටර්ස් ආයතනය වෙත යොමු කර ඇති අතර අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත. 8. GI – 4576 දරන කැබ් රථය - අළුත්වැඩියා කර ධාවනය සඳහා යෙදවීමට කටයුතු කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	පහත අංක සඳහන් වාහන හදිසි අනතුරුවලට ලක්වී ඇති අතර ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පහත දැක්වේ. (i) CAC 0172 දරන මෝටර් රථය හදිසි අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් 2024.07.22 දින මු.රෙ.104 (4)

	යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. (ii) KO 8812 දරන මෝටර් රථයේ හදිසි අනතුර 2023.08.17 දින සිදු වී ඇත. එම මෝටර් රථය අළුත්වැඩියාව සඳහා HI Tech Motors ආයතනය වෙත භාර දී ඇත. එම ආයතනය අළුත්වැඩියා කිරීමට නියමිත කොටස් පරීක්ෂා කර බලා 2023.12.10 දින ඇස්තමේන්තුවක් ලබා දී ඇති අතර එදින මු.රෙ. 104 (04) පරීක්ෂණ වාර්තාව ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 2024.01.12 දින පූර්ණ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. (iii) KX 7689 දරන මෝටර් රථය 2023.05.04 දින අනතුරට ලක්වී ඒ පිළිබඳ මු.රෙ. 104 (4) පරීක්ෂණ වාර්තාව 2023.12.04 දින ලබා දී ඇත. ඒ අනුව 2023.12.18 දින පූර්ණ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. (Vi) KX 7665 දරන මෝටර් රථයේ දකුණු පස පැති කණ්ණාඩිය බිඳී ඇති අතර එම පැති කණ්ණාඩිය ලියනගේ මෝටර්ස් ආයතනය විසින් මේ වන විට අළුත්වැඩියා කර ඇත. එබැවින් මු.රෙ.104 (4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	වර්තමානයේදී නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත නිදහස් කරනු නොලැබේ.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇති අතර "සොබාදම් පියස" ගොඩනැගිල්ල සඳහා වූ රැඳවුම් ගාස්තු නිදහස් කළ යුතුව පවතී. ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව අවසන් බිල්පත ගෙවූ පසු රැඳවුම් ගාස්තු නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.	2020.12.15 දිනැති අංක 02/02/ADM/විවිධ-10 ලිපිය මගින් සේවා අවශ්‍යතාවය මත පරිසර අමාත්‍යාංශය සඳහා දැනට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාවට වඩා සංවර්ධන නිලධාරීන් 30 දෙනෙකු අනුමත කර දෙන මෙන් මු.රෙ. 71 යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. තවද දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහාම පරිසර නිලධාරියෙකු පත් කරන ලෙසට කර ඇති ඉල්ලීම සලකා මගේ අංක 02/02/ADM/විවිධ-10 හා 2021.05.04 දිනැති ලිපිය මගින් පරිසර අමාත්‍යාංශය සඳහා සංවර්ධන නිලධාරි තනතුරු 391 ක් ඇති කිරීම සඳහා මු.රෙ.71 යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CM/11 හා 2023.01.25 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරීන් 299 ක් සඳහා මෙම අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍යාංශයට නවක සංවර්ධන නිලධාරීන් 597 ක් අනුයුක්ත කර තිබුණ ද 299 ක් සඳහා අනුමැතිය ලබා දී තිබීම ගැටළු සහගත වී ඇති බැවින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත අතිරික්ත සංවර්ධන නිලධාරීන් සඳහා අනුමැතිය ලබා දෙන ලෙස හෝ නැතහොත් වෙනත් රාජකාරී ස්ථානයකට ස්ථානගත කිරීම පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බව 2023.08.14 හා ADM/02/02/01 අංක දරන ලිපියෙන් දන්වා ඇත.
දෙවන කොටස	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මත පදනම්ව විවිධ දීමනා, රාජ්‍ය වියදම් පාලනය සිදු කිරීමේ අරමුණෙන් සැලසුම් සහගත පුහුණු ලබාදීම සීමා කරන ලදී. ඒ වන විට රටේ පැවති ඉන්ධන හිඟතාවය මත නිලධාරීන් රාජකාරී සඳහා වාර්තා කිරීම සිදුවූයේ වක්‍රීය ක්‍රමය මත පදනම්ව වන බැවින් අදාල වර්ෂය සඳහා සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් ප්‍රමාණය සීමා සහිත විය.

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ ගිණුම් සඳහා ලැබී ඇත්තේ තත්ත්වාගණනය කළ මතයකි. මෙම මතය සඳහා පදනම් වී ඇති කරුණු විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ දක්වා ඇති අතර ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය පහත දැක්වේ. (i). පරිසර අමාත්‍යාංශයට අයත් නොවන ඉඩම් වෙනුවෙන් දරන ලද වියදම් අමාත්‍යාංශයේ ගිණුම්වල දැක්වීම නිවැරදි කිරීමට කටයුතු කර ඇත. (ii). පරිසර අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල නීත්‍යානුකූලව පවරා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලීම් කර ඇත. ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. (iii). නොපියවූ අග්‍රිම ශේෂය වූ රු.260, 361.36 ක මුදල සම්පූර්ණයෙන් පියවා ඇත. (iv). තොග පොත හා අනෙකුත් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. (v). රාජ්‍ය නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය පවත්වාගෙන යනු ලැබේ.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	2021.11.19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කර ඇත. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග ප්‍රකාරව එම කාරක සභාව වෙත යැවිය යුතු ලෙස නියෝග කරන ලද වාර්තා සියල්ල යවා ඇත. කාර්ය සටහනේ සඳහන් අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත දැක්වේ. 1.මහනුවර නගරයේ අහිතකර වායූන්ගේ සංයුතිය සම්මත සාන්ද්‍රණයන්ට වඩා ඉහළ අගයක් ගන්නා බවට පර්යේෂණ වාර්තා ඉදිරිපත් වීම හේතුවෙන් එය පාලනය සඳහා සකස් කර තිබූ වැඩසටහන මේ වන විට ආරම්භ කර ක්‍රියාත්මක වේ. 2.ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කොරියානු ප්‍රදාන සහිතව විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරමින් පවතී.

	3.පරිසර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් පුද්ගලික සමාගමේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 4.යෝජිත හානිකර ආක්‍රමණශීලී ශාක හා සත්ත්ව විශේෂ මෙරටට පැමිණීම වැළැක්වීම හා එම ශාක හා සතුන් විනාශ කිරීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරීම සඳහා වඩා සුදුසු ආයතනය වන වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත. 5.දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය විසින් ලබාදුන් පරිගණක සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාගනිමින් පවතින අතර මේ වන විට මෙම පරිගණක උපයෝජනය කරමින් පවතී. 6.Climate Technology Center and Network (CTCN) ආයතනය විසින් 2017 වර්ෂයේ ව්‍යාපෘති යෝජනා කැඳවා ඒ අනුව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 03 ක් අතුරින් වඩාත් සුදුසු යෝජනාව වූ කුරුණෑගල නගර සභාව විසින් ඉදිරිපත් කරන ලද "සුහුරු නගර ව්‍යාපෘති යෝජනාව" අනුමත කරගෙන ඇත. 7.ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස බලපෑම සඳහා අනුහුරුවීමේ ජාතික සැලැස්ම යටතේ පිහිටුවීමට යෝජිත "දේශගුණ අනුහුරු අරමුදල" පිහිටුවීම සඳහා ජාතික අනුහුරු වීමේ සැලසුම් කිරීම සඳහා වන සූදානම් වීමේ ව්‍යාපෘතිය යටතේ ඊට අදාළ සියලුම අධ්‍යයනයන් ක්‍රියාවට නංවා ඇත.

රනිල් වික්‍රමසිංහ
පරිසර අමාත්‍ය